බදුකරණය පිළිබඳ හැඳින්වීම (Introduction of Taxation)

Lecturer:
Mr. Nuwan Sameera
ACA, ACPM, CTA(Reading), ACCA (finalist), M.Sc. in MGT SJP, B.Sc. (Accounting) Special 1st Class SJP, CTHE (RUSL),
Lecturer at Rajarata University in Sri Lanka

JMC vLearning
"your virtual learning partner"

ඉගෙනුම් ඵල

මෙම පරිච්ඡේදය අවසානයේදී ඔබට,

- බදුකරණයේ මූලික කාර්‍යයන්
- මූලික බදුකරණ මූලධර්ම සහ එහි වැදගත්කම
- ශ්‍රී ලංකාවේ ප්‍රධාන බදු වර්ග හඳුනාගැනීම
- ශ්‍රී ලංකාවේ බදු අධිකාරී ආයතන සහ ඒවායේ කාර්‍යභාරය
- ශ්‍රී ලංකාවේ ප්‍රධාන බදු වර්ග හඳුනා ගැනීම
- ආදායම් බදු අය කිරීමට අදාල ව්‍යවස්ථාපිත විධිවිධාන
- ආදායම් බදු අය කිරීම සහ ඊට අදාල මූලික සංකල්ප සම්බන්ධව අවබෝධයක් ලබා ගැනීමට හැකි වනු ඇත.

හැඳින්වීම

- රටක පරිපාලනමය අධිකාරිත්වය පවතින්නේ එහි රජය සතුවය. මේ අනුව, රටක පුරවැසියන්ගේ සුබසිද්ධිය උදෙසා කටයුතු කිරීම එහි ප්‍රධාන වගකීමක් වන අතර මේ සඳහා අවශ්‍ය වන සම්පත් පරිපාලනය කිරීම රජයේ මූලික වගකීමකි. රජයට මේ සඳහා අවශ්‍ය වන අරමුදල් සපයා ගැනීම විවිධ මූලාශ්‍ර ඔස්සේ සිදුවන අතර ඉන් සැලකිය යුතු අගයක් බදු ලෙස එකතු කෙරේ

- බද්දක් යනු රටක පුරවැසියෙකු විසින් රටේ යහපත සඳහා රජයට කරන අනිවාර්‍ය ගෙවීමක් හෝ දායකත්වයකි. රජය මෙලෙස සිදු කරන බදු අයකිරීම්, බදු, ගාස්තු, අයකිරීම්, දඩ මුදල් ආදී විවිධ නම් වලින් හැඳින්වේ. මෙලෙස සිදුවන බදු අයකිරීමේ ක්‍රියාවලිය බදුකරණය ලෙස හැඳින්වේ. බදුකරණයේ දී සෘජු බදු සහ වක්‍ර බදු ලෙස ආකාර දෙකකින් බදු පැනවීම දක්නට ලැබේ. මෙහිදී සෘජු බද්දක් ලෙස හැඳින්වෙන්නේ පුද්ගලික හෝ ආයතනික ආදායම මත සෘජුවම අයකරනු ලබන බදු වන අතර භාණ්ඩයක හෝ සේවාවක මිල මත අය කරන බදු වක්‍ර බදු ලෙස හැඳින්වේ.

බදුකරණයෙහි කාර්‍යයන්

- රජයක ප්‍රධාන වගකීම් සලකා බලමින් රජයේ ප්‍රධාන ආදායම් මාර්ගයක් වන බදු මගින් සිදුකරන කාර්‍යයන් බදුකරනයේ කාර්‍යන් ලෙස හඳුනාගත හැක. මේ අනුව බදුකරණයේ කාර්‍යයන්

  - *ප්‍රාථමික කාර්‍යයන්,*
  - *ආර්ථික කාර්‍යයන් සහ*
  - *සමාජීය කාර්‍යයන් ලෙස හඳුනාගත හැක.*

IMC vLearning "your virtual learning partner"

බදුකරණයේ මූලික කාර්‍යය

- රාජ්‍ය වියදම් සඳහා අවශ්‍ය අරමුදල් රැස්කිරීම බදුකරණයේ මූලික කාර්‍යය වේ. රජයක් විසින් තම රටෙහි පුරවැසියන් වෙනුවෙන් සිදුකලයුතු කාර්‍යයන් සඳහා අවශ්‍ය වන වියදම්, රාජ්‍ය වියදම් ලෙස හැඳින්වේ. උදාහරණයක් ලෙස ශ්‍රී ලංකාව තුල පුරවැසියන් සඳහා අවශ්‍ය වන විවිධ සේවාවන් නොමිලේ සැපයීමට රජය බැඳී සිටී.

නිදසුනක් ලෙස,

- රජයට පහත දැක්වෙන සේවා සැපයීම වෙනුවෙන්, ගෙවීමට සිදුවන වැටුප්, ප්‍රාග්ධන වත්කම් වල ආයෝජනය කිරීම හා නඩත්තු කිරීම සහ වෙනත් අයභාර ස්වරූපයේ වියදම් සඳහා අවශ්‍ය වන අරමුදල් සපයාගැනීමට සිදුවේ
  - *රාජ්‍ය ආරක්ෂාව - ත්‍රිවිධ හමුදාව සහ පොලිසිය රටෙහි ආරක්ෂාවතහවුරු කිරීමටත්, නීතිය සහ සාමය ස්ථාපිත කිරීම සදහාත් සිදු කරන විවිධ වියදම් වේ.*
  - *නිදහස් අධ්‍යාපනය - රජයේ පාසල් සහ විශ්වවිද්‍යාල මගින් නොමිලේ අධ්‍යාපනය ලබාදීම සඳහා සිදුකරන වියදම් වේ.*
  - *වෛද්‍ය සේවා - රජයේ රෝහල් මගින් නොමිලේ ලබාදෙන වෛද්‍ය සේවා සඳහා සිදු කරන වියදම් වේ.*
  - *රටෙහි මාර්ග පද්ධතිය නඩත්තු කිරීම සඳහා සිදු කරන වියදම්.*
  - *සහන මිලට විදුලිය / ජලය සහ වෙනත් පහසුකම් සැපයීම සඳහා සිදු කල යුතු වියදම් වේ.*

බදුකරණයේ ආර්ථික කාර්‍යයන්

❖**දේශීය හා විදේශීය ආයෝජන දිශානතිය සැකසීම**

පුද්ගලික අංශයේ ආයෝජන දිරිමත් කිරීමට හෝ අධෛර්‍යමත් කිරීමට බදු අනුපාත සහ දිරිගැන්වීම් වැනි බදුකරණ මෙවලම් භාවිතා කිරීම මෙහිදී සිදුවේ.

නිදසුනක් ලෙස,

විදේශ ආයෝජන ප්‍රවර්ධනය කිරීම සදහා ඉන් උපයන ආදායම් සදහා බදු නිදහස් කිරීම්

❖ආයෝජන මණ්ඩලය ආශ්‍රිත ව්‍යාපාර සදහා බදු නිදහස් කිරීම් සහ අඩු බදු අනුපාත නිර්දේශ කිරීම

❖අපනයන අශ්‍රිත ව්‍යාපාර සඳහා බදු සහන ලබා දීම.

❖ආනයන බදු වැනි මෙවලම් හරහා වැදගත් දේශීය කර්මාන්ත විදේශීය තරඟකාරීත්වයෙන් ආරක්ෂා කර ගත හැක.

JMC vLearning
"your virtual learning partner"

බදුකරණයේ සමාජ කාර්යයන්

❖**සමාජයට නුසුදුසු ක්‍රියාකාරකම් අධෛර්යමත් කිරීම**

මත්පැන් සහ දුම්කොළ පරිභෝජනය හෝ සූදු වැනි අනවශ්‍ය ක්‍රියාකාරකම් මැඩලීම සඳහා බදු මෙවලම් භාවිතා කිරීමයි

❖**සමාජය විසින් ප්‍රිය කරන ක්‍රියාකාරකම් දිරිමත් කිරීම**

ඉතුරුම්, විශ්‍රාම ආයෝජන, නවෝත්පාදන, පර්යේෂන සහ සංවර්ධන යනාදී සමාජ සුභ සාධනය සඳහා යෝග්‍ය ක්‍රියාකාරකම් බදු ක්‍රමය හරහා දිරිමත් කිරීමයි

❖**ආදායම් විෂමතාව අඩු කිරීම**

ධනවත් හා දුප්පතුන් අතර ආදායම් අසමානතාවය අඩු කිරීම සඳහා ප්‍රගතිශීලී බදු අනුපාත, බදු සහන සහ වට්ටම් ආදී බදු මෙවලම් බාවිත කිරීමයි.

බදුකරණයේ මූලධර්ම

❑සාධාරණත්වය (Equity)
❑නිශ්චිතභාවය (Certainity)
❑පහසුව සහ ස්වේච්ඡා අනුකූලතාව (Convenience and voluntary compliance)
❑ආර්ථිකමයබව (Economy)
❑ප්‍රගතිශීලිත්වය (Progressivity)
❑සරල බව (Simplicity)
❑පුළුල් පදනම (Braod base)
❑ප්‍රමාණවත් බව (Adequacy)

JMC vLearning
"your virtual learning partner"

බදු වර්ගීකරණය

බදු පුළුල් ලෙස සෘජු සහ වක්‍ර බදු ලෙස වර්ග කළ හැක

සෘජු බදු (Direct Taxes)

බදු ගෙවන්නා විසින් බදු උපයාගත් ආදායම් මත ගෙවීම සිදු වේ. බදු ගෙවන්නා සහ බදු බර දරන්නා දෙදෙනාම එකම පුද්ගලයෙකි. විතැන් කළ නොහැකියි

උදාහරණ: ආදායම් බදු

වක්‍ර බදු (Indirect Taxes)

අවසාන පාරිභෝජනය මත අය කරන බදු වේ. බදු ගෙවන්නා සහ බදු බර දරන්නා පුද්ගලයින් දෙදෙනෙකු වේ. විතැන් කළ හැකියි

උදාහරණ: එකතු කළ අගය මත බදු (VAT)

බදු වර්ගීකරණය

	සෘජු බදු	වක්‍ර බදු
බදු ගෙවීම	සෘජු බදු ගෙවන්නන් විසින් සෘජුවම රජයට ගෙවිය යුතුය.	බද්ද පනවන පුද්ගලයා හැර වෙනත් අයෙකු විසින් ගෙවීම කරනු ලැබේ.
බදු බර මාරු කිරීම	බදු බර මාරු කරන්න නොහැකිය.	බදු බර අවසාන පාරිභෝගිකයා වෙත මාරු කළ හැකිය.
එකතු කිරීමේ පිරිවැය	ස්වේච්ඡා අනුකූලතාවයක් නොමැති නම් එකතු කිරීමේ පිරිවැය ඉහළය.	එකතු කිරීමේ පිරිවැය අඩුය
බදු බර	සාමාන්‍යයෙන් සෘජු බදු ප්‍රගතිශීලී/ වර්ධනාත්මක (Progressive) වේ.	වක්‍ර බදු ප්‍රතිගාමී (Regressive) බලපෑමක් ඇති කරයි

JMC vLearning "your virtual learning partner"

ශ්‍රී ලංකාවේ ප්‍රධාන බදු අධිකාරී ආයතන

ශ්‍රී ලංකාවේ බදු පද්ධතිය පරිපාලනය කරන ආයතන බදු අධිකාරී ආයතන ලෙස හැඳින්වේ. මේ අනුව ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක වන බදු ක්‍රමය පාලනය කරන ආයතන ලෙස;

- දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
- පළාත් ආදායම් දෙපාර්තමේන්තුව
- රේගු දෙපාර්තමේන්තුව
- සුරාබදු දෙපාර්තමේන්තුව හැඳින්විය හැකිය.

ශ්‍රී ලංකාවේ ප්‍රධාන බදු

- **ආදායම් බදු (Income Tax) -** 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනත සහ මෙම පනත යටතේ නිකුත් කරන ලද ගැසට් නිවේදන මඟින් ආදායම් බද්ද පාලනය වේ. මෙම පනත 2018 අප්‍රේල් 01 වන දින සිට ක්‍රියාත්මක වේ. 2018 අප්‍රේල් 01 දිනට පෙර ආදායම් බදු සඳහා 2006 අංක 10 දරණ දේශීය ආදායම් පනත ක්‍රියාත්මක වියී

- **එකතු කළ අගය මත බද්ද (Value Added Tax/VAT)** - 2002 අංක 14 දරණ එකතු කළ අගය මත බදු පනත, පසුව වූ සංශෝධනයන් සහ පනත යටතේ ගැසට් නිවේදනයන් මඟින් පාලනය වේ.

- **මුද්දර ගාස්තු (Stamp Duty) -** 1982 පාර්ලිමේන්තුව විසින් මුද්දර ගාස්තු පනතේ අංක 43 පනවන ලද්දේ උපකරණ සහ ලේඛන සඳහා මුද්දර ගාස්තු පැනවීම සහ ඒ හා සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහායි. 2006 අංක 12 දරණ මුද්දර ගාස්තු පනත, එහි පසු සංශෝධනයන් සහ පනත යටතේ නිකුත් කර ඇති ගැසට් නිවේදනයන් මඟින් මුද්දර ගාස්තු පාලනය වේ.

ආදායම් බද්ද පැනවීම

2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 02 වන වගන්තිය මගින්, **බදු අය කළ හැකි ආදායමක්** ලබන **තැනැත්තෙකු** හෝ **අවසාන රඳවා ගැනීමේ ගෙවීමක්** ලබන තැනැත්තෙකු (Person) මත බදු වගකීම පනවයි

❖ **ගෙවීමට යටත් වන්නේ කවරෙකුද?**

අදාල වර්ෂය සඳහා බදු අයවන ආදායම් ඇති තැනැත්තා හෝ අවසාන රඳවා ගැනීමේ ගෙවීමක් ලබන තැනැත්තෙකි

ආදායම් බද්ද පැනවීම

❖ **බදු අයවන ආදායම යනු කුමක්ද?**

සේවා නියුක්ත ආදායම	xx
ව්‍යාපාර ආදායම	xx
ආයෝජන ආදායම	xx
අනෙකුත් ආදායම	xx
මුළු තක්සේරු කල ආදායම	xxx
(-) සුදුසුකම් ලබන ගෙවීම් සහ සහන - 52 වගන්තිය	(xx)
බදුවන ආදායම	xxx

JMC vLearning
"your virtual learning partner"

ආදායම් බද්ද පැනවීම

❖**ආදායම් බදු ගෙවීමට යටත් වන්නේ කවරෙක්ද?**

පහත පුද්ගලයන් බදු ගෙවීමට යටත් වේ.

- බදු අය කළ හැකි ආදායමක් ලබන තැනැත්තෙකු,
- අවසාන රඳවා ගැනීමේ ගෙවීමක් ලබන තැනැත්තෙකු,

දේශීය ආදායම් බදු පනතේ 195 වගන්තිය අනුව ,තැනැත්තා, යන්න පහත පරිදි නිර්වචනය කර ඇතී

තැනැත්තා, (Person) යන්නෙන් තනි පුද්ගලයෙකු (Individual) හෝ අස්ථිත්වයක් (Entity) අදහස් වන අතර,

- සංස්ථාගත හෝ සංස්ථාගත නොකළ පුද්ගල මණ්ඩලයක්
- පොල්මඃකරුවෙක්
- රාජ්‍ය නොවන සංවිධානයක් සහ
- - පුණ්‍යයාතනයක් ඊට ඇතුලත් වේ

අස්ථිත්වය, යන්නෙන් යම් **සමාගමක්, හවුල් ව්‍යාපාරයක් හෝ භාරයක්** අදහස් වන නමුත් යම් පුද්ගලයෙකු ඊට ඇතුලත් නොවේ.

ආදායම් බද්ද පැනවීම

❖**ආදායම් බද්ද ගණනය කළ යුත්තේ කුමන කාල පරාසයකට වරක්ද?**

- සෑම තක්සේරු වර්ෂයක් (year of assessment) සඳහාම ආදායම් බද්ද ගණනය කළ යුතුයි
- බදු කාලපරිච්ඡේදය (year of assessment) තක්සේරු වර්ෂය යනුවෙන් හ÷න්වයි

තක්සේරු වර්ෂය, යන්නෙන් යම් වර්ෂයක අප්‍රේල් මස පළමුවන (04/01) දිනෙන් ආරම්භ වී ඉක්බිතිව එළඹෙන වර්ෂයේ මාර්තු මස 31 වන දිනෙන් අවසන් වන මාස දොලහක කාලසීමාව අදහස් වේ

උදාඃ ලෙස, 2025/04/01 දිනෙන් ආරම්භ වී 2026/03/31 න් අවසන් වන මස 12 ක කාලපරිච්ඡේදය 2025/2026 තක්සේරු වර්ෂය ලෙස හ÷නාගත හැකියි

නමුත්, භාරයක් හෝ සමාගමක් එහි තක්සේරු වර්ෂය වෙනස් කිරීම සඳහා ආදායම් බදු කොමසාරිස්වරයාගෙන් ඉල්ලා සිටිය හැකිය. ඎ20(2) වගන්තිය% අවසර දුනහොත් ජනවාරි 01 දින සිට දෙසැම්බර් 31 වන දක්වා තක්සේරු වර්ෂයක් ලෙස සැලකිල්ලට ගනී.

JMC vLearning
your virtual learning partner"

වාසික නීතිය

බදු අරමුණ සඳහා යම් තැනැත්තෙකු වාසික හෝ නිර්වාසික ලෙස හ÷නාගත යුත්තේ ඇයි?

- වාසික තැනැත්තෙකු සම්බන්ධයෙන් වන විට, මූලාශ්‍රය කුමන ස්ථානයකින් පැන නැගුන ද එනම් ගෝලීය ආදායම මත. ශ්‍රී ලංකාවේ§ බද්දට යටත් වේ.

- නිර්වාසික තැනැත්තෙකු, සම්බන්ධයෙන් වන විට, එම තක්සේරු වර්ෂය තුල එම තැනැත්තා ශ්‍රී ලංකාවෙන් පමණක් උපයන ආදායම මත පමණක් ශ්‍රී ලංකාවේ§ බද්දට යටත් වේ



වාසික නීතිය

<u>තනි පුද්ගලයෙකු සම්බන්ධ වන විට</u>,

1. ශ්‍රී ලංකාව තුළ වාසය කරයි නම්,

   මෙමගින් අදහස් කරනුයේ,

   - ශ්‍රී ලංකව තුල ස්ථිර නිවසක් තිබීම
   - තැනැත්තාගේ පවුල (Family) ලංකාවේ ජීවත් වීම.

   යන කරුණු මත ශ්‍රී ලාංකික වාසය කිරීම තීරණය වේ.

2. එම වර්ෂය තුල ශ්‍රී ලංකාව තුළ කායිකව සිටී නම් සහ කායිකව සිටීමේ කාල සීමාවේ හෝ කාලසීමාවල මුළු එකතුව එම වර්ෂය තුල ආරම්භ වන හෝ අවසන් වන යම් මාස දොළහක කාලසීමාවක් තුලදී දින 183 ක් හෝ ඊට වැඩි ගණනක් වේ නම්,

3. එම පුද්ගලයා ශ්‍රී ලංකාවේ රජයේ සේවකයෙකු හෝ නිළධාරියෙකු වේ නම් සහ එම පුද්ගලයාගේ කාලත්‍රයා එම වර්ෂය තුළ විදේශයක ඇත්නම්,

4. වෙළඳ නැව් පනතේ අර්ථානුකූලව, ශ්‍රී ලංකා නෞකාවක සේවයේ නියුක්තව සිටින්නේ නම්, ඔහු එසේ සේවයේ නියුක්තව සිටින කාලසීමාව තුල,

ඉහත එක් නිර්ණායකයක්වත් සම්පූර්ණ වන්නේ නම්, එම පුද්ගලයා එම තක්සේරු වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ බදු කටයුතු සඳහා වාසික පුද්ගලයෙකු සේ සැලකේ.

JMC vLearning
"your virtual learning partner"

වාසික නීතිය

<u>සමාගමක් සම්බන්ධව වන විට,</u>

1. ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර හෝ පිහිටුවා ඇත්නම්,

2. එය ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර ඇත්නම් හෝ එහි ප්‍රධාන කාර්යාලය ශ්‍රී ලංකාවේ පිහිටුවන ඇත්නම් හෝ

3. තක්සේරු වර්ෂයේ යම් අවස්ථාවකදී එම සමාගමේ කටයුතු කළමනාකරණය සහ පාලනය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කර ඇත්නම්,

ඉහත එක් නිර්ණායකයක්වත් සම්පූර්ණ වන්නේ නම්, එම සමාගම එම තක්සේරු වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ වාසිකයෙකු වේ.

බදු සැලසුම්කරණය, බදු ගෙවීම මගහැරීමහා බදු ගෙවීමෙන් වැළකීම

- **බදු සැලසුම්කරණ යනු,**

රජය විසින් නියම කර ඇති ආදායම් බදු නීතිරීති මගින් අවසර දී ඇති සියළුම අඩු කිරීම්, දීමනා වට්ටම්, සීමාවන් යනාදිය උපරිම ලෙස භාවිතා කිරීමෙන් බදු වගකීම අවම කිරීමයි.

බදු සැලසුම්කරණයේ ප්‍රතිලාභයන්,

- පවතින් සියළු අඩු කිරීම්වලින් පූර්ණ ප්‍රතිලාභ ලබා ගනිමින් ගෙවිය යුතු බදු ප්‍රමාණය අඩු කිරීමයි.
- ඉතිරි කරන මුදල් ආයෝජනය කිරීමට සහ අතිරේක ආදායමක් උපයා ගැනීමට භාවිතා කළ හැක.
- බදු වගකීමක් ඇති බව කල්තියා දැන ගැනීමෙන් අනවශ්‍ය ආතතිය හා අවිනිශ්චිතතාව දුරුකර දැනුවත් තීරණ ගත හැකි නිසා අවසානයේ මනසේ සාමය ලබාගත හැකිය.

JMC vLearning "your virtual learning partner"

බදු සැලසුම්කරණය, බදු ගෙවීම මඟහැරීමහා බදු ගෙවීමෙන් වැළකීම

- **බදු මග හැරීම යනු,** යම් පුද්ගලයෙකුගේ බදු වගකීම අවම කිරීම සඳහා පවතින නීති රාමුව තුල ඔහුගේ මූල්‍ය කටයුතුවල සැකැස්මකි. දේශීය ආදායම් පනත යටතේ සියළුම නීත්‍යානුකූල අඩු කිරීම් ලබා ගැනීමෙන් ව්‍යාපාරවලට බදු මඟ හැරිය හැකිය. මෙය නීත්‍යානුකූල කටයුත්තකි. නමුත් සාදාචාර විරෝධීයී

- **බදු පැහැර හැරීම යනු,** හිතාමතා බදු අධිකාරීන් රවටා බදු නොගෙවා සිටීමට කරුනු ලබන සැලැස්මකි. එය අනිවාර්යය වරදකි. සාදාචාර විරෝධීය.

බදු පැහැර හැරීම සඳහා උදාහරණ නම්, - ආදායම් වාර්තා නොකිරීම - වියදම් වැඩියෙන් වාර්තා කිරීම

බදු සැලසුම්කරණය, බදු ගෙවීම මඟහැරීමහා බදු ගෙවීමෙන් වැළකීම

බදු සැලසුම් කිරීම	බදු මඟ හැරීම	බදු පැහැර හැරීම
නීත්‍යානුකූලය	නීත්‍යානුකූලය	නීතිවිරෝධීය
සදාචාරාත්මකය	සදාචාරාත්මකය නොවේ.	සදාචාරාත්මකය නොවේ.
නීතිමය බලය පරාජය කිරීමේ අදහසක් නැත.	නීතිමය බලය පරාජය කිරීමේ අදහසක් තිබේ.	ආදායම හා වියදම් වැරදි ලෙස අර්ථ දැක්වීම සඳහා විකෘති කිරීම.
බදු වගකීම ඇති වීමට පෙර සැලසුම් කිරීම සිදු කරයි.	බදු වගකීම ඇති වීමට පෙර බදු මඟ හැරීම සැලසුම් කරයි.	බදු වගකීම පැන නැගීමෙන් පසු බදු ගෙවීම පැහැර හැරීම සහ සම්බන්ධ වේ.
වෘත්තීයභාවය ප්‍රවර්තනය කරයි.	අල්ලස් දීම දිරිමත් කරයි.	අල්ලස් දීම දිරිමත් කරයි.